(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **2.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 ජනවාරි 19 බදාදා අ.භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **විමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු මයන්ත දිසානායක මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු හරීන් ප්‍රනාන්දු මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු උද්දික ප්‍රේමරත්න මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු නිපුණ රණවක මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2021 දෙසැම්බර් මස 20වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ගරු අගමැතිතුමනි, ගරු විරුද්ධ පක්ෂයේ නායකතුමනි, ගරු සභානායකතුමනි, ආණ්ඩුවේ සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ගරු අමාත්‍යවරුන් සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, පළමුවෙන්ම ඔබ සැමට නිරෝගී එළදායී සුභ නව වසරක් ප්‍රාර්ථනා කරමි!

ඔබ සියළු දෙනා දන්නා පරිදි පසුගිය වසර අප සියළු දෙනාටම ඉතාමත් අභියෝගාත්මක සහ පීඩාකාරී වසරක් විය. සමස්ත ලෝකයම වෙලාගත් කොවිඩ් -19 වසංගතය පාර්ලිමේන්තුවට ද එකසේ බලපෑවේය. එසේ වුවද අපගේ වගකීම් ඉටු කරමින් රටට වැදගත් කාරණා සම්බන්ධයෙන් සැසි පැවැත්වීමටත් 2022 වර්ෂය සඳහා අයවැය සම්මත කර ගැනීමටත් අපට හැකිවිය.

මෙම වකවානුව තුළ පාර්ලිමේන්තුවේ කටයුතු මනා ලෙස පවත්වාගෙන යාම සඳහා සහාය දැක්වූ සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් පාර්ලිමේන්තුවේ මහලේකම් තුමා විසින් මෙහෙයවනු ලබන කාර්ය මණ්ඩලයටත්, වේත්‍රධාරී තුමාටත්, ආරක්ෂක අංශ වලටත්, සෞඛ්‍ය බලධාරීන්ටත් මේ සම්බන්ධය සහාය දැක්වූ සියළු දෙනාටත් මගේ හද පිරි ප්‍රණාමය දැක්වීමට කැමැත්තෙමි.

2022 වර්ෂය නව ආරම්භයක් සනිටුහන් කරන අතර මෙම සභාව ද ඒ පිළිබඳ අවධානය දක්වා එහි යහපත සඳහා යම් යම් වෙනස්කම් සිදු කිරීම යෝග්‍ය වන බව මගේ අදහසයි.

සභාවේ පිවිසුම හරහා ඔබ සභාවට ඇතුලු වූ වහාම ඔබ සියලු දෙනා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස සලකනු ලැබේ. මෙම ගරු තනතුරු නාමය මඟින් අපේක්ෂා කරනු ලබන්නේ, පෙරළා සභාව වෙත ගෞරවයක් ඇති වන ආකාරයට ඔබ විසින් ගෞරවනීය ආකාරයකින් කතා කිරීම සහ හැසිරීම කළ යුතු බවයි. පාර්ලිමේන්තුවට පිවිසෙන අවස්ථාවේදී මා ඉගෙන ගත් ආකාරය එයයි. මා විසින් පළමු වරට පාර්ලිමේන්තුව තුළ කතා කරනු ලැබුවේ පුස්තකාලය තුළ පොත්පත් කියවමින් සහ ගරු ගාමිණී දිසානායක, ගරු රණසිංහ ප්‍රේමදාස, ගරු ලලිත් ඇතුලත්මුදලි වැනි කථිකයන්ගේ කතාවලට සවන් දීමෙන් හා ඔවුන් කථා කරන ආකාරය නැරඹීමෙන් සති ගණනාවක් සූදානම් වීමෙන් අනතුරුවයි. නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස, අප සම්බන්ධයෙන් වූ වඩාත්ම යහපත් වූ සංකල්පනාව සභාව වෙත ලබාදීමට අප හට අවශ්‍ය විය. මක්නිසාද යත් එලෙස නොකිරීම අප වෙත විශාල අවමානයක් විය හැකිව තිබුණු බැවිනි. නමුත් අද දවසේ, තම කතාව පැවැත්වීමට පෙර සූදානම් වනු ලබන්නේ, පුස්තකාලය භාවිතා කරනු ලබන්නේ හෝ අදාළ කරුණු කථා කරනු ලබන්නේ ඉතා සුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් විසිනි. පුස්තකාලය විසින් ලබාදී ඇති තොරතුරු අනුව, 2021 වර්ෂය තුළදී මන්ත්‍රීවරයන් විසින් කියවීම සඳහා පුස්තකාලයේ වෙතින් ලබාගෙන තිබුණේ පොත් 330 ක් පමණක් වන අතර එම පොත් වලින් 122ක්ම 'ප්‍රබන්ධ කතා' යන මාතෘකාව යටතේ වූ පොත් විය. එලෙස ලබා ගන්නා ලද පොත් වලින් 94ක් දේශපාලන විද්‍යාව පිළිබඳව වූ අතර 27ක් සමාජ විද්‍යාව පිළිබඳව විය.

කියවා ආපසු භාර දීම සඳහා ගරු මන්ත්‍රීවරයන් විසින් ලබාගෙන තිබෙන්නේ ආර්ථික විද්‍යාව පිළිබඳ පොත් 11 ක්, විද්‍යාව පිළිබඳ පොත් පහක්, නීතිය පිළිබඳ පොත් හතරක්, තාක්ෂණය පිළිබඳ පොත් තුනක්, අධ්‍යාපනය පිළිබඳ එක් පොතක් සහ සිංහල සාහිත්‍යය පිළිබඳ එක් පොතක් පමණි.

මන්ත්‍රීවරුන් 225 දෙනකු සිටින සභාවකට මෙය ලජ්ජා සහගතය.මෙම විෂය කරුණු සම්බන්ධයෙන් සූදානම සහ දැනුම නොමැතිකම, අපහාස, බොරු සහ අසත්‍ය චෝදනා වලටද පාර්ලිමේන්තුවට නුසුදුසු වචන භාවිතය කථාවල කොටසක් බවට පත්වීමටද, කථා සහ ප්‍රකාශන වලින් බොහොමයක් රාජ්‍යයට මහ පෙන්වීමට වඩා දේශපාලන වාසි ලබා ගැනීම

වෙනුවෙන් සිදු කරනු ලැබීමටද මඟ පාදා ඇත. මෙය අවසානයේ ලජ්ජා සහගත, පාර්ලිමේන්තුවට නොගැලපෙන හැසිරීම දක්වා වර්ධනය වේ.

සභාව සඵලදායක ලෙස මෙහෙයවීම සහ සියළු ගරු මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවන බවට වගබලා ගැනීම කථානායකවරයා ලෙස මගේ වගකීමයි. සභාව, එහි ස්ථාවර නියෝග සහ අනෙකුත් ක්‍රියා පටිපාටි ඒ වෙනුවෙන් පහසුකම් සැලසීම පිණිස සකස්කරනු ලැබ ඇත්තේ මන්ත්‍රීවරයන් ගෞරවනීය ආකාරයෙන් හැසිරෙනු ඇත යන විශ්වාසය ඇතිවයි.

මෙම ආයතනයේ ගෞරවය ආරක්ෂා කිරීම අප සියළු දෙනාගේම පරම පූජනීය වගකීම බව ගරු මන්ත්‍රීවරයන් සියළු දෙනාම අවබෝධ කරගත යුතුව ඇත. මෙම සභාව කෙරෙහි ජනතා විශ්වාසය නැති වුවහොත්, එයින් අදහස් වන්නේ ඔවුන් තුළ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි වන විශ්වාසය නැති වන බවයි. මෙම රටෙහි සියළු දේශපාලන පක්ෂ වලට හා පුරවැසියන්ට එයින් ඇති වන ප්‍රතිවිපාක බරපතල වනු ඇත. එය වටහාගෙන, සභාව තුළ නොවැදගත් දේශපාලන නාටක රඟදැක්වීම ඉවතලා, සියළු කාරණා වලදී ජාතික යහපත සහ ඔබ සැමගේ යහපත සිතෙහි දරාගෙන කටයුතු කරන ලෙස මම ඔබ සැමගෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලමි.මෙරට ජනතාව බරපතල දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටින අතර ඔවුහු රජය සහ විරුද්ධ පක්ෂය යන දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරුන් රාජ්‍ය තාන්ත්‍රිකයන් ලෙස වගකීම් සහගතව ක්‍රියා කිරීම අපේක්ෂා කරති.

මෙම ආයතනයේ ප්‍රතිරූපය නැවත ගොඩනැගීම සඳහා මා හට උපකාර කරන ලෙස සහ අපිට එය සාක්ෂාත් කරගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව මා සමග සාකච්ඡා කරන ලෙස මම ඔබ සියලු දෙනාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. දෙපාර්ශ්වයෙහි ම ප්‍රධාන සංවිධායකවරුන් විශේෂයෙන් ම මෙයට වඩා වගකීමෙන් යුතුව ක්‍රියාකරනු ඇතැයි සහ තමන්ගේ අදාළ පාර්ශ්වවලට මගපෙන්වීම ලබා දෙනු ඇතැයි මම අපේක්ෂා කරමි.

විවාදවල ගුණාත්මකභාවය සහ ගරු මන්ත්‍රීවරුන්ගේ චර්යාව වැඩිදියුණු කර ගැනීම සඳහා මම පහත සඳහන් යෝජනා කෙටුම්පත් කර ඇති අතර, එම යෝජනා සාකච්ඡා කර සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරමි:

> අයවැය සහ කාර්යසාධනයන් පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ට ස්වාධීන මතයක් ලබා දීමේ කාර්යය විශේෂයෙන් ම පැවරී ඇති ස්වාධීන පර්යේෂණ විශ්ලේෂණ කාර්යාලයක්;
>
> ආර්ථික විද්‍යාව, තාක්ෂණය, කළමනාකරණය, නායකත්වය, සමාජ විද්‍යාව සහ ඒ ආශ්‍රිත වෙනත් ඕනෑම මාතෘකාවක් පිළිබඳව සාකච්ඡා සහ එම ක්ෂේත්‍රයේ විශේෂඥයින් විසින් පවත්වනු ලබන ඉදිරිපත් කිරීම්. මෙම සාකච්ඡා සහ ඉදිරිපත් කිරීම් පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වූ පසුව සවස් කාලයේ දී පවත්වන ලෙසට ඕනෑම ගරු මන්ත්‍රීවරයෙකුට ඉල්ලා සිටිය හැක; සහ
>
> විවිධ භාෂා ඉගෙන ගැනීමට සහ අධ්‍යාපන කටයුතු ඉදිරියට කර ගෙන යාමට කැමැත්තක් දක්වන ගරු මන්ත්‍රීවරයන් සඳහා භාෂා සහ අධ්‍යාපන පහසුකම්.

මෙම ගරු පාර්ලිමේන්තුව වඩාත් හොඳින් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා මෙම යෝජනා වැඩිදියුණු කිරීමට හෝ මෙහි නිවැරදි කිරීමට කිසිවක් තිබේ නම් ඒවා ඉදිරිපත් කරන ලෙසට සහ වඩා හොඳ යෝජනා තිබේ නම් ඉදිරිපත් කරන ලෙසට මම සියලු මන්ත්‍රීවරයන්ට ආරාධනා කරමි.''

## II

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 දෙසැම්බර් 10 දින ම'විසින් 'විසර්ජන' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.''

## III

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 140 ප්‍රකාරව නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ සේවය කිරීම පිණිස මතු සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සභාපති නාමාවලියට ඇතුළත් කිරීමට මා විසින් නම් කර තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි:—

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු හේෂා විතානගේ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය"

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XIX කොටස;

(ii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXIII කොටස;

(iii) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXVIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXI කොටස; සහ

(iv) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VI හා VII කොටස්, තෙවැනි කාණ්ඩයේ IV හා V කොටස් සහ නවවැනි කාණ්ඩයේ I කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තිබිය යුතු යැයි ද, මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සහ 139 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයන අංශ සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 පෙබරවාරි 27 දිනැති අංක 2164/53 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා විය යුතු ය. අ.භා. 1.00ට ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව 2022 ජනවාරි 20 දින සිට අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සිට 9 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**7. තේරීම් කාරක සභාව (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114හි විධිවිධාන ප්‍රකාරව, නවවැනි

පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතීත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**8. තේරීම් කාරක සභාව (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, මතු සඳහන් සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනා (12) නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කළ යුතු ය:—

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50(2) සහ 111 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජනවාරි 19 දින සිට ආංශික අධීක්ෂණ කාරක සභාවලට සාමාජික මන්ත්‍රීවරයන් පත් කරන තෙක්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50(2) සහ 111 අත්හිටවිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121(1)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා, එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් අතරින් කාරක සභාව විසින්ම තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ අද දින සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 ජනවාරි 20 බ්‍රහස්පතින්දා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2022 ජනවාරි 20 බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. වරප්‍රසාද:** ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු නිරෝෂන් පෙරේරා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2021 ඔක්තෝබර් 21 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. කල් තැබීම (නව වැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය විවෘත කරමින් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

"ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(අ.භා. 2.23 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන් විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 2022 ජනවාරි 20 බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.

එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2022 ජනවාරි 20 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේ ය.